# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2384/44 – 2024 මැයි මස 18 වැනි සෙනසුරාදා – 2024.05.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(3) උපවගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(3) උපවගන්තිය යටතේ බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර රොෂාන් ගුණතිලක වන මා හට පැවරී ඇති බලතල ප්‍රකාරව නියම කරනු ලබන 2024 අංක I දරන බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික (සංශෝධිත) රීති මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන බව නිවේදනය කරමි.

තව ද, මෙම රීති ක්‍රියාත්මක වන දිනයට 2024, වර්ෂයට අදාළව ස්ථාන මාරු නියෝගයක් සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී ඇති අභියාචනයක් සම්බන්ධයෙන් හෝ මා වෙත ඉදිරිපත් කර ඇති අභියාචනයකට අදාළ තීරණයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මෙම රීති බාධාවක් නොවිය යුතු බව ද වැඩිදුරටත් නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී,
පීඑච්ඩී (ගෞරව) එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී,
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

වර්ෂ 2024 ක් වූ මැයි මස 13 දින,
බත්තරමුල්ල,
බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

රීති

01. මෙම රීති බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ වාර්ෂික ස්ථාන මාරු කිරීම් සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද ඊට අදාළ වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2364/32 හා 2023 දෙසැම්බර් 29 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයට* ඇතුළත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති සංශෝධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද පනවනු ලබයි.

02. මෙම රීති 2024 අංක 1 දරන බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික (සංශෝධිත) රීති වශයෙන් හඳුන්වයි.

03. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති 233 වගන්තියේ සිට 240 දක්වා වගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත වගන්ති ආදේශ කරනු ලැබේ :-

233. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ වාර්ෂික ස්ථාන මාරු කිරීම් සම්බන්ධයෙන් වාර්ෂික ස්ථාන මාරු කමිටු පත් කිරීම පහත ආකාරයට විය යුතු ය.

(1) ප්‍රධාන ලේකම් කාර්යාලය හා පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ඊට අනුබද්ධ ආයතන හා බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන අතර බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ මෙහි පහත සඳහන් සේවාවන්ට අදාළ වන වාර්ෂික ස්ථාන මාරු කිරීම් සම්බන්ධයෙන් ස්ථාන මාරු කමිටුවක් ප්‍රධාන ලේකම් විසින් ද, එක් එක් දෙපාර්තමේන්තු යටතේ වන දෙපාර්තමේන්තුගත තනතුරු සම්බන්ධයෙන් වාර්ෂික ස්ථාන මාරු කමිටු පත් කිරීම ස්ථාන මාරු කිරීම සඳහා අභිනියෝජන බලය ඇති ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ද සෑම වසරකම ජුනි මස 1 දිනට පෙර සිදු කළ යුතු ය.

(i) සංවර්ධන නිලධාරී සේවය
(ii) කළමනාකරණ සේවා නිලධාරී සේවය
(iii) කාර්යාල කාර්ය සහායක සේවය
(iv) රියදුරු සේවය

එසේ වුව ද, දෙපාර්තමේන්තුගත සේවාවන්ට අදාළ වන පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සංඛ්‍යාව 25 දෙනෙකුට වඩා අඩු වන විට දී ඒ සඳහා වන ස්ථාන මාරු කමිටුවක් පත් කිරීමට පූර්වෝක්තව ඊට අදාළ අවශ්‍යතාවය පිළිබඳ කරුණු ඉදිරිපත් කර දෙපාර්තමේන්තුව භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම් වෙතින් පූර්ව අනුමැතිය ලබා ගත යුතු ය.

(2) ප්‍රධාන ලේකම් විසින් පත්කරනු ලබන ස්ථාන මාරු කමිටුවක සංයුතිය ;

(අ) සියලු පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් පස්දෙනා,
(ආ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු),
(ඇ) දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රස්තුත සේවයේ හෝ නියුක්ත මුළු නිලධර සංඛ්‍යාවෙන් 15% ක් හෝ ඊට වැඩි සාමාජික පිරිසක් සිටින යථෝක්ත දෙපාර්තමේන්තුවට නොහොත් සේවාවට අදාළ එක් එක් වෘත්තීය සංගමයේ

හෝ,

පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා නිලධරයෙකු මුදාහැර ඇති එක් එක් වෘත්තීය සමිති සංගමයේ හෝ නියෝජිතයෙකුගෙන්,

සමන්විත විය යුතු වන්නේ ය.

ඉහත පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් අතරින් එක් සාමාජිකයෙකු කමිටු සභාපති විය යුතු ය.

(3) දෙපාර්තමේන්තු ප්‍රධානින් පත් කරනු ලබන මාරු කිරීම් කමිටුවක සංයුතිය ;

(අ) අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා,
(ආ) දෙපාර්තමේන්තු භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්,
(ඇ) දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රස්තුත සේවයේ හෝ නියුක්ත මුළු නිලධර සංඛ්‍යාවෙන් 15% ක් හෝ ඊට

වැඩි සාමාජික පිරිසක් සිටින යථෝක්ත දෙපාර්තමේන්තුවට නොහොත් සේවාවට අදාළ එක් එක් වෘත්තීය සංගමයේ

හෝ,

පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා නිලධරයෙකු මුදාහැර ඇති එක් එක් වෘත්තීය සමිති සංගමයේ හෝ නියෝජිතයෙකුගෙන්,

සමන්විත විය යුතු වන්නේ ය.

දෙපාර්තමේන්තු ප්‍රධානියා නිල බලයෙන්ම කමිටුවේ සභාපති විය යුතු ය.

(4) කලාප අධ්‍යාපන කාර්යාලයක ගුරු මාරු සම්බන්ධයෙන් පත් කරනු ලබන මාරු කිරීම් කමිටුවක සංයුතිය ;

(අ) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක,
(ආ) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්,
(ඇ) දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රස්තුත සේවයේ හෝ නියුක්ත මුළු නිලධර සංඛ්‍යාවෙන් 15% ක් හෝ ඊට වැඩි සාමාජික පිරිසක් සිටින යථෝක්ත දෙපාර්තමේන්තුවට නොහොත් සේවාවට අදාළ එක් එක් වෘත්තීය සංගමයේ

හෝ,

පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා නිලධරයෙකු මුදාහැර ඇති එක් එක් වෘත්තීය සමිති සංගමයේ හෝ නියෝජිතයෙකුගෙන්,
සමන්විත විය යුතු වන්නේ ය.

කලාප අධ්‍යපන අධ්‍යක්ෂ නිල බලයෙන් කමිටුවේ සභාපති විය යුතුය.

234. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කිසියම් තනතුරක වසර පහක සේවා කාලයක් සම්පූර්ණ කරන හා මාරු කිරීම් ක්‍රියාත්මක වන වර්ෂයේ ජනවාරි මස පළමුවෙනිදා වන විට වයස අවුරුදු 57 ක් නොඉක්මවන සෑම නිලධාරියෙක්ම වාර්ෂික ස්ථාන මාරු කිරීම් ප්‍රතිපත්තියට අනුකූලව හා මෙම රීති යටතේ සඳහන් විධිවිධානයන්ට යටත්ව සිදුකරන වාර්ෂික ස්ථාන මාරු කිරීමකට යටත් නිලධාරියෙකු වන්නේ ය.

235. වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය

(1) වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය සකස් කිරීමේ දී අභිනියෝජන බලධරයන් විසින් පහත කරුණු සැළකිල්ලට ගත යුතු ය.

(අ) භූගෝලීය පිහිටීම, අනුමත මූල්‍යමය ප්‍රතිලාභ, වෙනත් ප්‍රතිලාභ හා වරප්‍රසාද සහ ලැබෙන ස්ථානමාරු ඉල්ලීම් සංඛ්‍යාව මත පදනම්ව සේවා ස්ථාන ප්‍රියමනාප නොවන, ප්‍රියමනාප සහ ඉතා ප්‍රියමනාප යනුවෙන් කාණ්ඩවලට වර්ග කිරීම ;

(ආ) බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධරයකු වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීමට හේතු වන කිසියම් සේවා ස්ථානයක සේවය කළ යුතු අවම කාල සීමාව ;

(ඇ) බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධරයකු හට කිසියම් සේවා ස්ථානයක සේවය කිරීම පිණිස ඉඩ දෙනු ලබන උපරිම කාලසීමාව

(ඈ) බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා නිලධරයෙකුට වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්පතක් ඉදිරිපත් කිරීමට පදනම් වූ කරුණු ;

(ඉ) තම දැනුම හා දක්ෂතා පුළුල් ක්ෂේත්‍රයක් තුළ වර්ධනය කර ගැනීමට බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධරයාට අවස්ථාව සලසා දීම ;

(ඊ) භූගෝලීය වශයෙන් එකම ප්‍රදේශයක පිහිටි සේවා ස්ථාන අතර ස්ථාන මාරුවීම් ලබා ගනිමින් දිගින් දිගටම එකම සේවා ස්ථානයක රැඳී සිටීමට නිලධාරීන් දරන උත්සාහයන් වැළැක්වීම ;

(2) බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ වාර්ෂික ස්ථාන මාරු කිරීම සඳහා බලතල පවරන ලද සෑම අභිනියෝජිත බලධරයෙකු විසින් ම මෙම රීතීන්ට අනුකූලව මෙන්ම සේවාවලට සහ තනතුරුවලට අදාළ සේවා ව්‍යවස්ථාවන් හෝ බඳවා ගැනීමේ පටිපාටිවල සඳහන් කොන්දේසි සැලකිල්ලට ගනිමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ඒ ඒ තනතුරු හා සේවා සම්බන්ධයෙන් වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය සකස් කර බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශ සහිතව ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත් කර අනුමත කර ගත යුතු ය.

(3) ආණ්ඩුකාරවරයා විසින් මෙම රීති යටතේ අනුමත කරන ලද ස්ථාන මාරු කිරීම් ප්‍රතිපත්තිය බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් නිල වෙබ් අඩවියට ඇතුළත් කර බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සියලු තනතුරුලාභීන් වෙත දැන ගැනීමට සැලැස්විය යුතුය.

(4) ආණ්ඩුකාරවරයා විසින් ඉහත (2) උපවගන්ති යටතේ අනුමත කරන ලද වාර්ෂික ස්ථාන මාරු කිරීම් ප්‍රතිපත්ති වලට අනුකූලව හා මෙම රීති යටතේ සඳහන් විධිවිධානයන්ට යටත්ව පමණක් වාර්ෂික ස්ථාන මාරු කිරීම් ක්‍රියාවලිය සිදු කළ යුතුය.

236. වාර්ෂික ස්ථාන මාරු කිරීම් අයදුම්පත්‍ර කැඳවීම

(1) වාර්ෂික ස්ථාන මාරු කිරීම් පිළිබඳ බලය අභිනියෝජන බලධරයා විසින් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධරයන් වෙතින් වාර්ෂික ස්ථාන මාරු කිරීම් අයදුම්පත්‍ර කැඳවීම පිළිබඳ දැන්වීම් සෑම වසරකම ජූනි මස 30 වැනි දිනට පෙර නිකුත් කළ යුතු අතර එමඟින් වාර්ෂික ස්ථාන මාරු කිරීම් සඳහා අයදුම්පත්‍ර මෙම රීති යටතේ වාර්ෂික ස්ථාන මාරු කිරීම සඳහා සුදුසුකම් ලබන සියලු බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධරයන් විසින් එම වර්ෂයේ ජූලි මස 31ට පෙර අභිනියෝජන බලධරයන් වෙත ඉදිරිපත් කරන ලෙසට එම දැන්වීම මගින් නියම කර තිබිය යුතුය.

(2) මෙම රීති යටතේ වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා සුදුසුකම් ලබන බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කිසියම් නිලධරයෙකු (1) උපවගන්තිය යටතේ අයදුම්පත් ඉදිරිපත් කර නොතිබීම එම නිලධරයා වාර්ෂික ස්ථාන මාරු කිරීමකට බාධාවක් ලෙස නොසැළකිය යුතුය.

(3) වාර්ෂික ස්ථාන මාරුකිරීම් සඳහා සුදුසුකම් ලබන ඊට අදාළ අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා අයදුම්කර නොමැති සියලු නිලධරයන් පිළිබඳ තොරතුරු සෑම වර්ෂයකම ජූලි මස 10 වැනි දිනට පෙර මෙම රීති යටතේ පත් කරනු ලබන ස්ථාන මාරු කමිටුව වෙත ඉදිරිපත් කිරීමට අදාළ බලධාරියා විසින් කටයුතු කිරීම අනිවාර්ය විය යුතු ය.

(4) සෑම ස්ථාන මාරු කමිටුවක් විසින්ම මෙම රීති හා වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියට අනුව කටයුතු කරමින් වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ කමිටු යෝජනා සෑම වසරකම අගෝස්තු මස 15 වැනි දිනට පෙර අදාළ අභිනියෝජන බලධාරියා වෙත ඉදිරිපත් කිරීමට ක්‍රියාකළ යුතු අතර, එසේ ඉදිරිපත් කිරීමේ දී නිර්දේශවලට පදනම් වූ හේතු යථා පරිදි වාර්තාගත කිරීමට ද වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ වගකීම වන්නේ ය.

(5) සෑම වසරකම අගෝස්තු මස 31 වැනි දිනයට පෙර යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ තීරණ ඇතුළත් දැන්වීම අභිනියෝජිත බලධාරියා විසින් අනුමත කර බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ සියලු නිලධාරීන්ගේ දැනුවත් වීම සඳහා ප්‍රධාන ලේකම් නිල වෙබ් අඩවියට ඇතුළත් කර ප්‍රසිද්ධ කළ යුතු ය.

(6) වාර්ෂික ස්ථාන මාරු කිරීම් පිළිබඳව බලය අභිනියෝජන බලධරයා විසින් ලබාදුන් තීරණයකින් අතෘප්තියට පත් වූ කිසියම් නිලධරයෙකු හෝ සේවකයෙකු විසින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම් එවැනි අභියාචනයක් මෙම රීති යටතේ සඳහන් උපලේඛන 1 ට අනුකූලව අනුව පමණක් සියලු තහවුරු කිරීමේ ලියවිලිවල සහතික කළ පිටපත් ද සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(7) මෙම රීතියට අනුව ප්‍රසිද්ධ කරන ලද අභිනියෝජන බලධාරියා විසින් අනුමත කර ඇති වාර්ෂික ස්ථාන මාරු කිරීම් තීරණ පිළිබඳව අතෘප්තියට පත්වන නිලධාරියෙකු විසින් අභිනියෝජන බලධාරියා අදාළ තීරණය සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත සිය අභියාචන ඉදිරිපත් කිරීම සඳහා වන හැකියාව සහ ඒ සඳහා අවසර ඇති කාලසීමාව පිළිබඳව අභිනියෝජන බලධාරියා වාර්ෂික ස්ථාන මාරුකිරීම් තීරණ යටතේම සඳහන් කර තිබිය යුතු ය.

237. (1) වාර්ෂික ස්ථාන මාරු කිරීම් සම්බන්ධයෙන් ඉහත 236 වගන්තිය යටතේ අභිනියෝජන බලධාරියාගේ තීරණ සම්බන්ධයෙන් අතෘප්තියට පත්වන අයෙකු එකී තීරණ ප්‍රසිද්ධ කළ දිනයේ සිට රජයේ වැඩ කරන දින 14ක් ඇතුළත බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනය කළ හැකි අතර එවැනි වූ අභියාචනයක් අදාළ ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ අමාත්‍යාංශ ලේකම්වරයා අභිනියෝජන බලධාරියා මගින් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු ය.

(2) නිලධරයා විසින් අවශ්‍ය යැයි හැඟෙන්නේ නම් (1) උපවගන්තියෙහි විධිවිධානයන්ට අනුකූලව ඉදිරිපත් කරන අභියාචනයෙහි ප්‍රගමන පිටපතක් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත සෘජුවම ඉදිරිපත් කිරීමට නිලධරයාට අවසර ඇත්තේ ය.

(3) බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාර දෙනු ලබන වාර්ෂික ස්ථාන මාරු අභියාචනයකට අදාළව ලිපි ගොනු, වාර්තා හා සිය නිරීක්ෂණ ඇතුළත් වන පරිදි මෙහි (1) උපලේඛනය හා (2) උපලේඛනයට අනුකූල වූ වාර්තා අදාළ අභියාචනය සමඟ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාවෝචිත පරිදි අභිනියෝජන බලධාරියා, පළාත් අමාත්‍යාංශ ලේකම්වරයා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා විසින් ක්‍රියා කළ යුතුය.

(4) බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන වාර්ෂික ස්ථාන මාරු තීරණයන්ට අදාළ වන අභියාචන සම්බන්ධයෙන් එම කොමිෂන් සභාවේ තීරණ සැප්තැම්බර් 30 වැනි දිනට පෙර බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියට ඇතුළත් කළ යුතු ය.

238. (1) වාර්ෂික ස්ථාන මාරු කිරීම් තීරණ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණයක් පිළිබඳව අතෘප්තියට පත්වන නිලධරයෙකු ඊට අදාළ අභියාචනය නියමිත ධූරාවලිය යටතේ අභිනියෝජන බලධාරියා මගින් බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත් කළ හැකිය.

(2) ඉහත (1) උප වගන්ති යටතේ බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා අවසර ඇති කාල සීමාව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවිය තුළ පළකරන දින සිට රජයේ වැඩ කරන දින 14ක කාල සීමාවක් විය යුතුය.

(3) ඉහත (2) උපවගන්තිය යටතේ බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත් වන වාර්ෂික ස්ථාන මාරු කිරීම් අභියාචන සම්බන්ධයෙන් අදාළ වන තීරණ සෑම වසරකම නොවැම්බර් මස 30 වැනි දිනට පෙර අදාළ අභිනියෝජන බලධාරියාට පිටපත් සහිතව අභියාචක වෙත දැනුම් දිය යුතු ය.

239. (1) මෙම රීති යටතේ ලබා දී ඇති අභියාචන කාල සීමාව තුළ ඉදිරිපත් නොවන සෑම අභියාචනයක්ම අභියාචන බලධාරියා විසින් ප්‍රතික්ෂේප කළ යුතු ය.

(2) වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් වෙත ඊට අදාළවන මාරු නියෝග සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වන දිනට පෙර නිකුත් කළ යුතු අතර එහි මාරු නියෝගය යටතේ මාරු කිරීම් ක්‍රියාත්මක විය යුතු දිනය අනුගාමී වර්ෂයේ ජනවාරි මස 1 වැනි දින හෝ අභිනියෝජිත බලධාරියා විසින් තීරණය කරනු ලබන ඊට ආසන්න ඉදිරි දිනයක් විය යුතුය.

240. වාර්ෂික ස්ථාන මාරු කිරීම් නියෝග නියමිත දිනයට ක්‍රියාත්මක කිරීම.

(1) වාර්ෂික ස්ථාන මාරු කිරීම් නියෝගයක් ලබා සිටින පළාත් සභා රාජ්‍ය සේවා නිලධරයෙකුට නියමිත දිනයේ දී නව සේවා ස්ථානයෙහි රාජකාරි කටයුතු භාරගැනීමට හැකිවන සේ වර්තමාන සේවා ස්ථානයෙන් ඔහු නියමිත පරිදි නිදහස් කිරීමට අදාළ පළාත් අමාත්‍යාංශ ලේකම්වරයා හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා හෝ ක්‍රියාකළ යුතු වන්නේ ය. එසේම නියම කර ඇති පරිදී නියමිත දිනට නව සේවා ස්ථානයේ රාජකාරි සඳහා වාර්ථා කිරීම ස්ථාන මාරු නියෝගය ලද නිලධරයාගේ ද වගකීම වන්නේය.

(2) වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලබා සිටින නිලධරයෙකුට නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි වර්තමාන සේවා ස්ථානයෙන් විධිමත් ලෙස මුදා හැරීමට කටයුතු නොකරන බලධරයන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීම අදාළ විනය බලධරයින්ගේ වගකීම වන්නේ ය.

(3) වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලබා ඇති නිලධරයෙකු තම ආයතනයෙන් මුදාහැරීම සඳහා ඔහුගේ අනුප්‍රාප්තිකයා පැමිණෙනතෙක් නොසිට ඔහුගේ රාජකාරි කටයුතු ආවරණය කිරීමට තාවකාලික වැඩ පිළිවෙලක් අභ්‍යන්තර වශයෙන් යොදාගැනීමට පළාත් අමාත්‍යාංශ ලේකම්වරයා හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා හෝ ක්‍රියාකල යුතු වන්නේ ය.

(4) තම කාර්යය මණ්ඩලයේ නිලධරයෙකු වෙත වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලද වහාම ඔහු භාරයේ ඇති රාජකාරි ලිපිගොනු, ලිපිලේඛන, රජය හෝ පළාත් සභාව සතු අනෙකුත් දේපළ, යතුරු, පරිගණක මුරපද හා රාජකාරි හැඳුනුම්පත ආදිය එම ස්ථාන මාරු කිරීම් නියෝගය ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව භාර දීමට අවශ්‍ය විධිවිධාන යෙදීමට පළාත් අමාත්‍යාංශ ලේකම්වරයා හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා හෝ කටයුතු කළ යුතු වන්නේ ය. එසේම තමන් භාරයේ ඇති සියලු දෑ යථා පරිදි භාරදීම සඳහා අවශ්‍ය විධිවිධාන තම ප්‍රධානියා සමඟ සාකච්ඡා කර සලසා ගැනීම වාර්ෂික ස්ථාන මාරු කිරීම් නියෝගය ලද නිලධරයාගේ ද වගකීම වන්නේ ය.

(5) වාර්ෂික ස්ථාන මාරු කිරීම් නියෝගයක් මත නියමිත පරිදි පූර්ව සේවා ස්ථානයෙන් නිදහස් කරන ලද නමුත් නියමිත පරිදි නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයෙකු සිය කැමැත්තෙන් තනතුර අතහැර ගියා සේ සලකා බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයෙහි XIII වන පරිච්ඡේදය ප්‍රකාරව කටයුතු කිරීම යථායෝග්‍ය පරිදි නව සේවා ස්ථානය අයත් පළාත් අමාත්‍යාංශ ලේකම්වරයාගේ හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ ආයතන ප්‍රධානියාගේ හෝ වගකීම වන්නේ ය.

(6) නව සේවා ස්ථානයේ ප්‍රධානියාට ඉහත (5) වන උපවගන්තියෙහි සඳහන් කර ඇති පරිදි කටයුතු කිරීමට හැකිවනු පිණිස ස්ථාන මාරු කිරීම් නියෝග ලබා සිටින නිලධරයා සේවා ස්ථානයෙන් මුදාහැරීමට අදාළ ලිපියෙහි පිටපතක් නව සේවා ස්ථානයේ ප්‍රධානියා වෙත යොමු කළ යුතු ය.

*උපලේඛනය 1*

**................ වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම.**

**අභියාචක නිලධරයා පිළිබඳ තොරතුරු**

අ. පෞද්ගලික තොරතුරු

| | | | |
|---|---|---|---|
| 1. මුලකුරු සමඟ නම :- | | | |
| 2. තනතුර හා පන්තිය :-<br>(ශ්‍රේණිය) | | | |
| 3. උපන් දිනය :-<br>අවුරුදු/මාස/දින | 4. වයස :- අවු ........... මාස .......... දින ..............<br>(20 ...... .12.31 දිනට) | 5. ජාතික හැඳුනුම්පත් අංකය :- | 6. ස්ත්‍රී / පුරුෂ භාවය |
| 7. ස්ථිර ලිපිනය :- | 8. තාවකාලික ලිපිනය :- | 9. දුරකථන අංකය :-<br>කාර්යාලය :-<br>පෞද්ගලික :- | |
| 10. විවාහක / අවිවාහක බව :- | 11. කලත්‍රයාගේ නම :- | 12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය :- | |
| 13. දරුවන් ගණන :- | 14. ඔවුන්ගේ වයස :- | 15. ඉගෙනුම ලබන පාසල් :- | |

ආ. සේවා තොරතුරු

| | | | | |
|---|---|---|---|---|
| 16. තනතුරට පත්වූ දිනය :- | | | | |
| 17. වර්තමාන සේවා ස්ථානය :- | | | 18. සේවා ස්ථානය පිහිටි නගරය :- | |
| 19. වර්තමාන සේවා ස්ථානයට වාර්තා කළ දිනය :-<br>අවු .......... මාස ....... දින ........ | | | 20. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය (20 ..... .12.31 දිනට)<br>අවු ........ මාස ........ දින ........ | |
| 21. ප්‍රතිලාභ ලබන (ප්‍රිය මනාප) සේවා ස්ථානයක / ස්ථානවල සේවය කර තිබේ ද? | | | | |
| 22. රජයේ සේවයේ සේවය කරන ලද පූර්ව සේවා ස්ථානය | සේවා ස්ථානය | ප්‍රිය මනාප සේවා ස්ථානයකි / ප්‍රිය මනාප නොවන සේවා ස්ථානයකි | සේවා කාලය | |
| | | | සිට<br>අවු ....... මාස ...... දින ....... | දක්වා<br>අවු ....... මාස ...... දින ....... |
| | 1 | | | |
| | 2 | | | |
| | 3 | | | |
| | 4 | | | |
| | 5 | | | |
| | 6 | | | |

ඇ. වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)

| | | | | |
|---|---|---|---|---|
| 23. | වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර | ඇත | | ස්ථාන මාරු අයදුම්කර ඇත්නම් අයදුම් කර ඇති සේවා ස්ථාන<br><br>1<br>2<br>3<br>4<br>5 |
| | | නැත | | |
| වාර්ෂික ස්ථාන මාරු ලැබී තිබේ නම් එම සේවා ස්ථානය | | | | |
| 24. ස්ථාන මාරු චක්‍රය සමන්විත වන නිලධරයින් ගණන .................................. | | | | |
| 25. ස්ථාන මාරු සමාලෝචන කමිටුවට අයදුම් කර | | ඇත | | |
| | | නැත | | |
| 26. සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලම පිළිබඳ තොරතුරු | | | | |
| ස්ථාන මාරු අවලංගු කිරීම | | | ස්ථාන මාරුව සංශෝධනය කිරීමට ඉල්ලුම් කළේ නම් එසේ ඉල්ලුම් කළ සේවා ස්ථානය<br>01 ....................................................<br>02 ....................................................<br>03 .................................................... | |
| සංශෝධනය කිරීම | | | | |
| නව ස්ථාන මාරුවක් ලබා ගැනීම | | | | |
| ස්ථාන මාරු අභිනියෝජන බලධාරීත්වයේ තීරණය | | | | |

28.ස්ථාන මාරු අභිනියෝජන බලධාරීත්වයෙහි තීරණයට එරෙහිව බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හේතු

01. ....................................................................................................................
02. ....................................................................................................................
03. ....................................................................................................................

29. ඉහත හේතු සනාථ කිරීමට අදාළ ලිඛිත සාධකවල සහතික කළ පිටපතක් පහත දැක්වෙන ඇමුණුම් වශයෙන් යා කර ඇත.

ඇමුණුම (01)
....................................................................................................................
ඇමුණුම (02)
....................................................................................................................
ඇමුණුම (03)
....................................................................................................................

30. ඉල්ලා සිටිනු ලබන සහන

1. ....................................................................................................................
2. ....................................................................................................................
3. ....................................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

| | |
|---|---|
| ........................................... | .................................................... |
| දිනය | අත්සන |

ඇ. පළාත් අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

1. නිලධරයා/ නිලධාරිනිය විසින් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් තොරතුරු ඔහුගේ / ඇයගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදි බව සහතික කරමි.

2. වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන අභියාචන නිර්දේශ කරමි/ පහත සඳහන් හේතු මත නිර්දේශ නොකරමි.

i. ...........................................................................
ii. ...........................................................................
iii. ...........................................................................

3. අනුප්‍රාප්තිකයෙකු රහිතව අභියාචක නිදහස් කළ හැක/නොහැක.

| | |
|---|---|
| ........................................... | .................................................... |
| දිනය | අත්සන |

ඉ. ස්ථාන මාරු අභිනියෝජන බලධාරීත්වයෙහි නිර්දේශය

i. ස්ථාන මාරු චක්‍රය සම්බන්ධ නිලධරයින් ගණන : .....................................................
i. අභියාචක පිළිබඳ නිර්දේශය : ....................................................................................................
..........................................................................

| | |
|---|---|
| ........................................... | .................................................... |
| දිනය | අත්සන |

*උපලේඛනය 2*

**................ වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා ඉදිරිපත් කිරීම.**

**අනුප්‍රාප්තික නිලධරයා පිළිබඳ තොරතුරු**

i. අභියාචක නිලධරයාගේ නම හා තනතුර : ................................................................................

ii. අභියාචක නිලධරයාට අදාළ අනුප්‍රාප්තික නිලධරයා පිළිබඳ තොරතුරු

අ. පෞද්ගලික තොරතුරු

| | | | |
|---|---|---|---|
| 1. මුලකුරු සමඟ නම :- | | | |
| 2. තනතුර හා පන්තිය :-<br>(ශ්‍රේණිය) | | | |
| 3. උපන් දිනය :-<br>අවුරුදු/මාස/දින | 4. වයස :- අවු ........... මාස .......... දින ..............<br>(20 ...... .12.31 දිනට) | 5. ජාතික හැඳුනුම්පත් අංකය :- | 6. ස්ත්‍රී / පුරුෂ භාවය |
| 7. ස්ථිර ලිපිනය :- | 8. තාවකාලික ලිපිනය :- | 9. දුරකථන අංකය :-<br>කාර්යාලය :-<br>පෞද්ගලික :- | |
| 10. විවාහක / අවිවාහක බව :- | 11. කලත්‍රයාගේ නම :- | 12. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය :- | |
| 13. දරුවන් ගණන :- | 14. ඔවුන්ගේ වයස :- | 15. ඉගෙනුම ලබන පාසල් :- | |

ආ. සේවා තොරතුරු

| | | | | |
|---|---|---|---|---|
| 16. තනතුරට පත් වූ දිනය :- | | | | |
| 17. වර්තමාන සේවා ස්ථානය :- | | | 18. සේවා ස්ථානය පිහිටි නගරය :- | |
| 19. වර්තමාන සේවා ස්ථානයට වාර්තා කළ දිනය :-<br>අවු .......... මාස ....... දින ........ | | | 20. වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය<br>(20 ..... .12.31 දිනට)<br>අවු ........ මාස ........ දින ........ | |
| 21. ප්‍රතිලාභ ලබන (ප්‍රිය මනාප ) සේවා ස්ථානයක / ස්ථානවල සේවය කර තිබේද? | | | | |
| 22. රජයේ සේවයේ සේවය කරන ලද පූර්ව සේවා ස්ථානය | සේවා ස්ථානය | ප්‍රියමනාප සේවා ස්ථානයකි / ප්‍රිය මනාප නොවන සේවා ස්ථානයකි | සේවා කාලය | |
| | | | සිට<br>අවු ....... මාස ...... දින ....... | දක්වා<br>අවු ....... මාස ...... දින ....... |
| | 1 | | | |
| | 2 | | | |
| | 3 | | | |

<table>
<tr><td colspan="6">ඇ. වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න)</td></tr>
<tr><td rowspan="2">23. වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර<br>1.<br>2.<br>3.</td><td>ඇත</td><td></td><td colspan="3" rowspan="2">ස්ථාන මාරුව සංශෝධනය කිරීමට ඉල්ලුම් කලේ නම් එසේ ඉල්ලුම් කළ සේවා ස්ථාන<br>1<br>2<br>3</td></tr>
<tr><td>නැත</td><td></td></tr>
<tr><td rowspan="2">වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුවට අයදුම් කර</td><td rowspan="2"></td><td colspan="2">ඇත</td><td colspan="2" rowspan="2"></td></tr>
<tr><td colspan="2">නැත</td></tr>
<tr><td colspan="6">25. වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුව වෙත කරන ලද ඉල්ලීම</td></tr>
<tr><td>ස්ථාන මාරුව අවලංගු කිරීම</td><td></td><td colspan="4" rowspan="3">ස්ථාන මාරුව සංශෝධනය කළ යුතු / නව ස්ථාන මාරුවක් ලබාදිය යුතු සේවා ස්ථාන<br>01 ....................................................<br>02 ....................................................<br>03 ....................................................</td></tr>
<tr><td>සංශෝධනය කිරීම</td><td></td></tr>
<tr><td>නව ස්ථාන මාරුවක් ලබා ගැනීම</td><td></td></tr>
</table>

26. ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණ

27. අභියාචකගේ අනුප්‍රාප්තික නිලධරයා බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර තිබේද / නැද්ද යන්න

..........................................................................................................

28. අභියාචකගේ ඉල්ලීම ඉටු කළහොත් අනුප්‍රාප්තික නිලධරයාට අගතියක් නොවන පරිදි ස්ථාන මාරු චක්‍රය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ස්ථාන මාරු අභිනියෝජන බලධාරීත්වයේ නිරීක්ෂණය හා නිර්දේශ :

.....................................................................................................................................................................................
.....................................................................................................................................................................................
.....................................................................................................................................................................................
.....................................................................................................................................................................................

............................................ ....................................................
දිනය අත්සන

EOG 05 - 0136

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.